*බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 3 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි*

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.-

ලුහුඩු නාමය

1. මේ ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2006 අංක 05 දරන බඩු උකස්ගන්නන්ගේ (සංශෝධන ) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2001 අංක 3 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලබන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 3 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 3 වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(1) බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම සාප්පුවක් හෝ ශාඛාවක් වෙනුවෙන්ම ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා ප්‍රධාන ලේකම්වරයා විසින් වෙන් වෙන් වශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන නොයා යුතු ය. "

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය." යන වචන වලට ඉක්බිතිව "කිසියම් බඩු උකස් ගන්නකු විසින් එකකට වැඩි සාප්පු ප්‍රමාණයක් හෝ ශාඛාවන් ප්‍රමාණයක බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන විටෙක ඒ එක් එක් සාප්පුව හෝ ශාඛාව සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. " යන වචන ඇතුළත් කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) උප වගන්තියේ "සෑම ඉල්ලුම් පත්‍රයකම "යන වචන වලට ඉක්බිතිව "මුල් "යන වචනය ඇතුළත් කිරීමෙන්.

(3) ඒ වගන්තියේ (3) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුලත් කිරීමෙන් .-

"(4) වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අලුත් නොකර බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ උකස් ගන්නකු වෙත වාර්ෂික බලපත්‍රය නිකුත් කරන්නේ නම්, බලපත්‍රයක් නොමැතිව බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම වර්ෂයක් සඳහාම අදාල බලපත්‍ර ගාස්තුව ද, බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරය පවත්වාගෙන ගිය සෑම මාසයක් සඳහාම අදාල බලපත්‍ර ගාස්තුවෙන් 10% ක් බැගින් වූ මුදලක ප්‍රමාද ගාස්තුවක් ද අය කළ යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වගන්තියේ "බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් නොමැත්තේ ය. "යන වචන ඉවත් කොට "බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, එසේ ලබා ගැනීමට ද හිමිකම් නොමැත්තේ ය. " යන වචන ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වගන්තියේ 1වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "45(2) වගන්තියේ ප්‍රකාර මෙම ප්‍රඥප්තිය යටපත් කරනු ලබන සෑම වරදකටම වරදකරු කරනු ලබන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නම් සඳහන් " යන වචන වෙනුවට "45 (2) වගන්තියේ ප්‍රකාර මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලබන කිසියම් වරදකට වරදකරු කරනු ලැබ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නම සඳහන් " යන වචන ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වගන්තියේ "රුපියල් ලක්ෂයක් මුදලින් ඇප නොතබන" යන වචන ඉවත් කොට "ප්‍රධාන ලේකම්වරයා විසින් නියම කරනු ලබන බැංකුවක මුදලින් රුපියල් ලක්ෂයක් ඇප නොතබන "යන වචන ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "තුන්වන උපලේඛනයේ " යන වචන වෙනුවට "දෙවන උපලේඛනයේ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "දොළොස් මාසයක " යන වචන වෙනුවට "මාස විසි හතරක " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ "ප්‍රධාන ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකු හෝ විසින් " යන වචන වෙනුවට "ප්‍රධාන ලේකම්වරයා නැතහොත් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ "(ග) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ග ප්‍රධාන ලේකම්වරයාගෙන් විධිමත් බලපත්‍රයක් ලබා නොගෙන හෝ වාර්ෂික බලපත්‍ර අළුත් කරවා නොගෙන බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. "

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ඇතුලත් කරනු ලැබේ. –

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දණ්ඩන 44 (1) මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විටෙක, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

(2) වාර්ෂික බලපත්‍රය අළුත්නොකර උකස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන උකස් ගන්නකුට 44 (1) වගන්තිය යටතේ දක්වා ඇති දණ්ඩනවලට අමතරව අයවීමට ඇති හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ හිඟ වාර්ෂික බලපත්‍ර ගාස්තු වලින් 10% කට සමාන මුදලක් දඩයක් ලෙස අයකර ගැනීමට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතුය. මෙම උපවගන්තිය යටතේ අධිකරණය විසින් අයකරනු ලැබූ සෑම මුදලක්ම, පළාත් සභා අරමුදලට බැර කළ යුතුය."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වගන්තිය 45 (1) උප වගන්තිය ලෙස සංශෝධනය කරනු ලැබේ. ඉන් ඉක්බිතිව පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුල් කරනු ලබන අතර එම වගන්තිය "45 (2)" උප වගන්තිය ලෙසට බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) ඉහත 45 (1) උප වගන්තිය යටතේ වැරදකරු කරනු ලබන සෑම තැනැත්තකුගේම නම, පෞද්ගලික ලිපිනය, ව්‍යාපාර නාමය හා ව්‍යාපාරය පවත්වා ගෙන ගිය ස්ථානයේ ලිපිනය, ප්‍රධාන ලේකම්වරයා විසින් රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතුය."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වගන්තියේ (අ) උපවගන්තිය ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 "(අ)" වන වගන්තිය ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය 47 (1) උප වගන්තිය ලෙස සංශෝධනය කරනු ලැබේ. ඉන් ඉක්බිතිව පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය "47 (2)" උපවගන්තිය ලෙසට බලාත්මක විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) සෑම බඩු උකස් ගන්නකු විසින්ම, ස්වකීය ව්‍යාපාරය පිළිබඳ වාර්ෂික ගිණුම් වාර්තාවක් ඊට පසුව එන වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ වාර්ෂික ගිණුම් වාර්තා නියමිත දිනට පෙර ඉදිරිපත් නොකිරීම වරදක් වන්නේ ය."

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි "අමාත්‍යවරයා " යන යෙදුමේ අර්ථ කථනයට කලින් පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, .–

"බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා " යන්නෙන් ප්‍රධාන ලේකම්වරයා හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ලේකම්වරයෙකු හෝ වෙනත් නිලධාරියකු අදහස් වේ ;

(2) එහි "පළාත් සභාව" යන යෙදුමේ අර්ථ කථනයට කලින් පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:-
"පොලිස් නිලධරයා" යන්නෙන්, නිළ ඇඳුමෙන් සිටින පොලිස් සාමාජිකයකු අදහස් වේ ; සහ

"පොලිස් නිලධරයා" යන්නෙන්, නිළ ඇඳුමෙන් සිටින පොලිස් සාමාජිකයෙකු අදහස් වේ ; සහ

(3) එහි "සාප්පුව" වන යෙදුමේ අර්ථ කථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්.-

"සාප්පුව" යන්නෙන් ව්‍යාපාරික ස්ථානයක්, ගුදමක් ව්‍යාපාරික ස්ථානයක්, සමාගමක්, හවුල් ව්‍යාපාරයක්, බද්ධ ව්‍යාපාරයක්, ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් සහ ඉහත සඳහන් කිසිවක ශාඛාවක් වශයෙන් පවත්වා ගෙන යනු ලබන කවර හෝ ස්ථානයක් අදහස් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ "අ" ආකෘතිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කරනු ලැබේ.

"පළමුවන උපලේඛනය

"අ" ආකෘතිය

බලපත්‍රය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 3 දරන බඩු උකස්කරන්නන්ගේ ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයා විසින් ...................................... ප්‍රාදේශීය ලේකම් ................. වන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව .................... යන ස්ථානයෙහි .......................නමින් බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාමට .................. පදිංචි ...............ට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2001 අංක 3 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ මෙයින් බලය දී බලපත්‍ර දෙමි.

මේ බලපත්‍රයේ කාලය ....................12.31 වන දින අවසන් වන්නේ ය.

.....................................
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය."

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

17. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

04-167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.